මගේ අංකය - 5/5/1/6/2026

**ආයතනික විභාග සංවිධාන ශාඛාව,**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,

පැලවත්ත, බත්තරමුල්ල.

2026.06. 17

දහම් පාසල් ප්‍රධානීන් වෙත,

**දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2026**
**අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්**

උක්ත විභාගය සඳහා අයදුම්පත් කැඳවමින් 2026.06.26 වන දිනැතිව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවන අතර අයදුම්පත් සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව දන්වමි.

02. අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර එහි පිටුපස මුද්‍රණය කර ඇති උපදෙස් ඉතා සැලකිල්ලෙන් කියවන ලෙස කාරුණිකව දන්වමි. **අයදුම්පතෙහි අවසානයෙහි ආයතන ප්‍රධානියාගේ නම, අත්සන හා දිනය යොදා දහම් පාසල් නිල මුද්‍රාව තැබිය යුතුය.**

03. අයදුම්පතෙහි 2.0 ශීර්ෂය යටතේ ඔබ දහම් පාසලට **මේ සමඟ ලබා දී ඇති අංක 7කින් යුතු පරිගණක අංකය සඳහන් කළ යුතුය.** මෙම අයදුම්පත් එවන ලද ලිපි කවරයේ අලවා ඇති ඔබගේ ලිපිනයේ SCH NO. යනුවෙන් සඳහන්ව ඇත්තේ ද එම අංකයයි. දහම් පාසලට අදාළ කරුණු පිළිබඳව විමසීමේදී මෙම පරිගණක අංකය සඳහන් කළ යුතුය.

04. **සෑම අයදුම්කරුවකු විසින්ම විභාග ගාස්තු පහත පරිදි ගෙවිය යුතුවේ.**

| පෙනී සිටින අවස්ථාව | දහම් පාසල් අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු විභාග ගාස්තු | බාහිර අයදුම්කරුවන් විසින් ගෙවිය යුතු විභාග ගාස්තු |
|---|---|---|
| ප්‍රථම වතාව | නිදහස් | රු. 200/- |
| දෙවන වතාව සහ ඊට පසු වතාව | රු. 200/- | රු. 200/- |
| ඌන සාමර්ථ්‍යය ලැබූ විෂයය සඳහා | රු. 50/- | රු. 50/- |

අයදුම්කරුවන් සියලු දෙනාටම අදාළ වන මුළු විභාග ගාස්තුව දිවයිනේ ඕනෑම තැපැල් / උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද **කුවිතාන්සියේ මුල් පිටපත අයදුම්පත සමඟ අමුණා එවිය යුතු වේ.** කුවිතාන්සියේ ඡායා පිටපතක් ලබා ගෙන එය සුරැකිව ඔබ වෙත තබා ගන්න.

05. බාහිර අයදුම්කරුවන්ට පෞද්ගලිකව විභාගයට අයදුම් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. එවැනි අයදුම්කරුවන් තම පදිංචි ස්ථානයට ආසන්නව ඇති දහම් පාසල මඟින් අයදුම් කළ යුතු බවට ඔවුන් වෙත උපදෙස් ලබා දී ඇත. එබැවින්, ඔබ ප්‍රදේශයේ යම් බාහිර අයදුම්කරුවකු පැමිණ මෙම විභාගයට ඉදිරිපත්

වීමට අවස්ථාව සලසා දෙන ලෙස ඉල්ලා සිටියහොත් ඔහුගේ / ඇයගේ සුදුසුකම් ගැසට් නිවේදනයේ සඳහන් පරිදි සපුරා ඇති බව සනාථ කර ගෙන විභාග ගාස්තු අයකර ඔබගේ දහම් පාසල මඟින් අයදුම් කිරීමට අවස්ථාව සලසා දෙන ලෙස විශේෂයෙන් ඉල්ලා සිටිමි.

06. තමන්ගේ සම්පූර්ණ නම හා අනෙකුත් විස්තර නිවැරදිව ඇතුළත් කර ඇති බව හොඳින් සනාථ කර ගත් පසුව, අයදුම්පතේ තම අත්සන යෙදිය යුතු බවට අයදුම්කරුවන්ට උපදෙස් ලබා දෙන්න. සෑම අයදුම්කරුවකුම අයදුම්පතේ අංක 13.0 යටතේ තම අත්සන තැබිය යුතු අතර එසේ අත්සන් කරවා ගැනීම දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයාගේ වගකීම වේ.

07. අයදුම්පත් පිටපත් දෙකකින් සම්පූර්ණ කර මුල් පිටපත **(නිල් පැහැති) විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව,** ශ්‍රී ලංකා විභාග **දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල** යන **ලිපිනය සඳහන් මේ සමඟ එවා ඇති කවරය තුළ** බහා **2026 ජූලි මස 24** වන දිනට පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** සුදු පැහැති දෙවන පිටපත ඔබගේ දහම් පාසලේ සුරැකිව තබා ගත යුතුය. අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බව කාරුණිකව දන්වමි. ප්‍රතික්ෂේපිත අයදුම්පත් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බලනු නොලබන බව වැඩිදුරටත් දන්වමි.

සුජීව විජේරත්න,  
නියෝජ්‍ය විභාග කොමසාරිස් (ආයතනික විභාග සංවිධාන),  
විභාග කොමසාරිස් ජනරාල් වෙනුවට